# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 අගෝස්තු

සමාජීය විද්‍යා පීඨය

## පුස්තකාල හා විඥාපන විද්‍යාව

**ග්‍රන්ථ විඥාපන පාලනය; සූචිකරණ න්‍යාය හා භාවිතය LISC – 28214**

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

අනිවාර්ය ප්‍රශ්නය

01. i. ග්‍රන්ථ නාම පිටු අංක (01) සඳහා ග්‍රන්ථ විස්තරය පමණක් සම්පාදනය කරන්න. (ලකුණු 08)

ii. පහත ග්‍රන්ථ විස්තර සඳහා සුදුසු ප්‍රධාන හා අතිරේක ශීර්ෂ පමණක් සකස් කරන්න. (ලකුණු 03 බැගින්)

අ) දිවියා/ගිසෙප් ටොමාසි ඩි; ලැම්පඩුසා; පරිවර්තනය එස්. නන්දලාල් •—

ආ) Classical Mechanics / Herbert Golden, Charlos P. Poole and Jone L. Safko •—

ඇ) ගංවතුර/ සෝමසිරි පට්ටියආරච්චි •—

ඈ) හින්දී කථන හුරුව/ මහාචාර්ය ඉන්ද්‍රා දසනායක සහ ආචාර්ය ලක්ෂ්මන් සෙනෙවිරත්න •—

02. i. ග්‍රන්ථ විඥාපන පාලනය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05)

ii. ග්‍රන්ථ විඥාපන පාලනයේ අවශ්‍යතාව ලැයිස්තුගත කරන්න. (ලකුණු 05)

iii. විවිධ ග්‍රන්ථ විඥාපන සේවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

03. i. යන්ත්‍ර පාඨ්‍ය සූචිකරණ ආකෘතිය (MARC 21) කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05)

ii. නූතන උපයෝජක (user) තොරතුරු අවශ්‍යතා සැපිරීමට යන්ත්‍ර පාඨ්‍ය සූචිකරණය (MARC 21) ආකෘතිය භාවිතයේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 15)

04. "මූලාශ්‍රය විස්තරය සහ ප්‍රවේශය (RDA) සූචිකරණ නීති සංග්‍රහය ඇංග්ලෝ ඇමෙරිකානු සූචිකරණ නීති සම්ප්‍රදායේ (AACR) විප්ලවීය වෙනසක් ලෙස හැඳින්විය හැක." උක්ත කියමන එකී නීති සංග්‍රහ ද්විත්වයෙහි ඇති සමාන අසමානතා ඇසුරින් විවේචනාත්මකව විස්තර කරන්න. (ලකුණු 20)

05. i. විවිධ සූචි බාහිර ස්වරූප වර්ග නම් කරන්න. (ලකුණු 05)

ii. ඒ අතරින් මාර්ගගත පොදු ප්‍රවේශ සූචියෙහි (OPAC) සුවිශේෂතා හා ගුණාංග නිදසුන් දෙමින් විස්තර කරන්න. (ලකුණු 15)

06. i. ඇංග්ලෝ ඇමෙරිකානු සූචිකරණ නීති සංග්‍රහයේ දෙවැනි සංස්කරණයේ (AACR2) ඓතිහාසික වර්ධනය ලැයිස්තුගත කරන්න. (ලකුණු 07)

ii. ඇංග්ලෝ ඇමෙරිකානු සූචිකරණ නීති සංග්‍රහයේ දෙවැනි සංස්කරණයේ නීති ව්‍යුහය පහදන්න. (ලකුණු 07)

iii. එහි සුවිශේෂතා හඳුන්වන්න. (ලකුණු 06)

07. පහත මාතෘකා අතරින් <u>හතරක් (04)</u> පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. අන්තර්ජාතික ප්‍රමිත ග්‍රන්ථ විස්තරයෙහි (ISBD) ග්‍රන්ථ නාමය හා වගකීම් ප්‍රකාශනය
ii. වර්ගීකෘත සූචියක් සඳහා වූ නීති සංග්‍රහය
iii. විෂය සූචිකරණය
iv. සූචිකරණ අරමුණු
v. ආයතන කර්තෘ (ලකුණු 05 බැගින්)

08. සූචියක ශීර්ෂ යනු කවරේදැයි හඳුන්වා විවිධ ශීර්ෂ වර්ග උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 20)

*********************************